# අලුත් ඉස්කෝලෙට ගිහින්




සිත ගත සිහිල් සුවයකින් වෙළා ඇදබැඳ තබා ගන්නා තරමේ වූ මඳ නලින් සහ තුරුළුනා, කෙත් වතුවලින් සපිරුණු සුන්දර වටපිටාවකින් හෙබි හොරාණ-කලුවැල්ලාව මහා මාර්ගයේ බුලත්සිංහල වෙල්යාය කෙළවර මනරම් කඳු ගැටයක් මත, පාරට යන්තම් පෙනෙන දුරින් බුලත්සිංහල ජෙෂ්ඨ පාඨශාලාව පළාතේ දරුවන්ගේ අනාගත මාවත් හෙළි පෙහෙළි කරමින් වැජඹුණේ උදාරම් ලීලාවෙනි.

එක් දහස් නවසිය පනස් හතේ අවුරුද්දේ එක්තරා දවසක මෙම පාඨශාලාවට මම ද ඇතුළත් වුණෙමි. තාත්තා සහ ගුණපාල මල්ලි සමග කරල්දැක්මේ මාවින් කොන්දොස්තර මහතාගේ රබර් වත්ත මැද තිබූ නිවසින් පාන්දර හයට පමණ පිටත් වූයේ රබර් ගස් සෙවණින් ලා අඳුරු පැහැ ගත් අඩි පාර ඔස්සේ ය. රබර් වත්තේ අඩි පාර දිගේ පැමිණ වත්ත කෙළවර කුඹුරු යායේ මහ වේල්ල දිගේ එනවිට පාවහන් නොමැති පා ඇඟිලිමරුං අතරින් එළියට මතුවුණු මඩ සහිත දෙපා, කුඹුර කෙළවර දෙපාවට බැස සෝදා ගෙන ගුරු පාරට ගොඩ වුණෙමු. අතුර-පරගොඩ ගුරු-තාර පාර, කරල්දැක්කුවේ රාළහාමිලාගේ ගෙවල් අසලින් තාර කට්ටියට ගොඩ වී ඇළේ මහ පාලමට ඉතාමත් සුළු දුරකින් ඇති නොමිමර එකේ කණුව ළඟ දී නැවත ගුරු පාරට වැටී කරල්දැක්කුව වෙල අද්දර ඇළේ පාලමත්, වෙල මැද ඇති බෝක්කුවත්, වෙල කෙළවර මාළු අල්ලන බෝක්කුවත් පසු කළ විට යළි තාර කට්ටියට ගොඩ වේ. එතැන් සිට දකුණතට දිගට ම තාර පාර ය. වම් අතට ඇති පාරෙන් ගියොත් පුංචි කුඹුරු යායක් මැදින් වේලි උඩින් ගොස් කැරකෝප්පුව ළඟින් අතුර කඩ මණ්ඩියට ළඟාවිය හැකි ය. තාර පාර දිගේ ගිය අප අතුරේ දෙමළ ඉස්කෝලය ළඟින් හොරණ කලුවැල්ලාව පාරට වැටී දකුණාව හැරී පාර දිගට ඇති මහා රුස්ස ගස් සහිත කැලෑවෙහි අඳුරු සෙවණ අතරින් පාසලට පැමිණෙන විට හත පසුවී තිබුණි. පාසල ළං ළං වන විට ඇසුණු ළමයින්ගේ කෑ ගැසීමේ ශබ්දය පාසලට පැමිණෙන විට ක්‍රමයෙන් මහා ඝෝෂාවක් ලෙස දෙසවන් තුළට කිඳා බසිමින් වැඩුණි.

මිදුලට ගොඩවන කෙළවරේ මිදුල මට්ටමට සමතලා නොකොට අඩක් කපා තිබූ කඳු ගැටය දිගට ජේලියට සිට උදලුවලින් පස් කපන ළමයින් පිරිසකි. දිගට දමා ඇති ලණු පොටවල් කීපයකින් ළමයින් කීප දෙනෙකු ඇදගෙන යන ලෑල්ලකි. එම ලෑල්ලට උස අතට සවිකොට ඇති ලීය පොළොවට කෙළින් වන සේ තබා දෑතින් වැරෙන් අල්ලා ගෙන, ලෑල්ලට එක පය බැගින් තබාගත් ළමයින් දෙදෙනෙකි. ලෑල්ලට රොක්වන පස් නියමිත තැනකට වේගයෙන් ඇදගෙන ගොස් මිදුලේ පැත්තක කෙළවරින් පහළට බැස යන විට ලෑල්ල අල්ලා සිටින ළමයි එය අතහැර ඉවත් වෙති. ඇදගෙන යන පිරිස වැටෙමින් නැගිටිමින් නවත් තරමක් දුරට ලෑල්ල සමග ගොස් දුවමින් හිනාවෙමින් නටමින් ආපසු එන දර්ශනය දෙස බලා සිටියේ මිදුල මැද ඇති අඹ ගස යට සිට ය. අඹ ගසට තරමක් ඈතින් මිදුලේ අලුතින් ගොඩනගා ගෙන යන්නේ පුංචි විහාර ගෙයක් බව හිමවා ඇති කොටස දෙස බැලූ විට තේරුම් ගත හැකි ය. පොළ් අතු සෙවිල්ලන ලද බොහෝ දිග ශාලා දෙකක් එකට යාව තිබුණු අතර ඒවා වටේට ගසා තිබුණේ ලෑලි ය. කාර්යාලය සහිත දිග ස්ථිර ශාලාව අතින් පැත්තට වෙන්නට තිබුණි.

මහා ඝෝෂාවක් ලෙස දෙසවන් තුළ තෙරපෙමින් තිබුණු ළමයින්ගේ කෑකෝ ගැසීමේ ශබ්දය එකවිට ම නැවැත්වීමට එක සීනු නාදයකට හැකි විය.

පාසල් වත්ත පුරා සිටි ළමයින් වහා දුවගෙන පැමිණ මිදුල මැද ජේලි කීපයකට සැදුණු ආකාරය දෙස අපි බලා සිටියෙමු. ළමයින්ගේ වරු වුරු ශබ්දය නැවත ඝෝෂාවක් බවට පත් වුණේ ජේලි සැදීමෙන් පසුව ය.

ප්‍රධානාචාර්යතුමා ඇතුළු ගුරු මණ්ඩලය ළමයින් ඉදිරියේ ළමයින් වෙතට මුහුණ ලා ජේලියට සිටි-මෙන් පසු අපට පැහැදිලිව පෙනෙන්නට සිටි ළමයෙක් සාක්කුවෙන් උළුපත් පෑන ගෙන එහි විල්ල ඇද ගලවා දෙතොලට කිටිටු කොට නළාවක හඬ නැගූ අතර සියලු ම ළමයි මෙන් ම ගුරුවරු ද වැඳ ගත්හ.

උස මහත ගැහැනු ළමයකු විසින් පදයෙන් පදය පවසන තිසරණ සහිත පන්සිල් ගැනීමට අපගේ අත් ද ඉබේ ම එසවුණි. පන්සිල් ගැනීමෙන් අනතුරුව ගුරු මණ්ඩලයේ ගුරුවරියක විසින් කරන ලද දේශනය අවසානයේ ළමයින් සියල්ලන් ම තම තමන්ගේ පන්තිවලට යෑමට ජේලියට ගමන් ඇරඹුවත්, මොහොතකින් ජේලි සුනුවිසුනු වී එකි-නෙකා තම තමන්ගේ පන්තිවලට දුවන ආකාරය දැක ගැනීමට හැකි විය.

දැන් අප ප්‍රධානාචාර්යතුමාගේ කාමරය අසල ය. ලැබුණු කැඳවීමෙන් ඇතුළට ගියෙමු. අප දෙදෙනා ඉස්සර කර ගත් තාත්තා මඳ සිනාවෙන් යුතුව ප්‍රධානාචාර්යතුමාට හිස පහත් කොට දෑත් එක්කොට ආයුබෝවන් කියා, ගෙන ආ බුලත් අත් දෙක අප දෙදෙනා අත තැබුවේ ''දීලු වැදපන්'' කියා රහසින් පවසමිනි. මගෙන් අසන ලද ප්‍රශ්නවලට ගැහෙන හඬින් ගොත ගසමින් උත්තර දුන්නෙමි. තුනේ පන්තියට මා ඇතුළත් කෙරුණු අතර ගුණපාල මල්ලි හෝඩියේ පන්තියට ඇතුළත් කෙරිණ.

නුහුරු නුපුරුදු පරිසරයක නුහුරු නුපුරුදු පන්තියකට යාමට තිබූ චකිතය වඩ වඩාත් දැනෙන්නේ දැන් ය. වැඩිහිටි ගුරුවරියක් මා තුනේ පන්තියක් අසලට ඇරලුවා ය. පන්තිය ඇතුළට යාමට ඇතිවුණු බිය මුසු හැඟීම විසින් මගේ පා ගමන් වේගය බිඳුව කිටිවුවට ම බැස තිබුණි.

''මොකද මේ ළමය? අලුතින්ද ආවේ? මොකක්ද පන්තිය? මෙහෙට එනව.'' වේවැලක් එක් අතකින් ගෙන අතින් අතින් කළුළඳුල්ලේ යමක් ලියමින් සිටි ජාතික ඇඳුම ඇඳගත් සුදු මිටි ගුරු මහතා පන්තිය දෙස බලන විටදී මා දැක විමසුවේ ය.

හිත ගැහෙයි. ඒත් මා දැන් යා යුතු ය. ක්‍රමයෙන් වැඩි වුණු පා ගමන් වේගය ගුරු මහතාගේ මේසය අසල නැවතිණ. ළමයින්ගේ දෑස් මා වෙත යොමු වී තිබෙනවා ඇත. මගේ දෑස් ගුරු මහතාගේ මුහුණේ ය.

''මොකක්ද නම?''
''පි පි ''
''ඇහෙන්න ඇහෙන්න කියනව''
''පියසේන''
''කෝ ඔය අතේ තියෙන පොත් ගන්නව බලන්න''

කිසිවක් නොලියා තිබූ හිස් පොත් තුන හා ගල්ලෑළුල්ල මා දුන්නා නොව ගුරුතුමා උදුරා ගත්තා ය යි කීවොත් වඩා හරි ය.

''මොකක්ද පන්තිය?''
''තුනේ කැලෑසිය''
''ඒ ද බී ද?''

එයට උත්තර දීමට මම නොදැනිමි. මා කලින් ගිය ඉහළ කරන්නාගොඩ පාසලේ එහෙම දෙයක් නැත. එහි තිබුණේ හෝඩිය, පළවෙනිය, දෙක තුන යනාදී කැලෑසි ය. මගේ නිරැත්තරකම ළමයින්ගේ සිනහවට ලක් විය.

''අර එහා පන්තියට යනව.'' එය මට තවත් ගැටලුවකි. එම පන්තියට ගිය විට යළි අසනු ලබන ප්‍රශ්නවලට උත්තර දිය යුතු ය. මොනවා අහයි ද? ඒ වුණත් යා යුතු ය. ආපසු හැරී එම පන්තිය දෙස බලා නැවත බිමට බර කරගත් දෙනෙතින් යුතුව ඊ ළඟ පන්තියේ දොරකඩට ගියෙමි.

එහි සිටියේ ගුරුවරියකි. මා පන්තියට ඇතුළුවන විට ම ඇය මට අතවැනුවා ය. මම ඉක්මන් ගමනින් ඇය අසලට ගියෙමි.

''අලුතෙන් නේද ආවේ?.''
''මගේ ඔළුව ඉහළට පහළට වැහිණි.
''තුනේ පන්තියද?''
යළි හිස ඉහළට පහළට වැනෙයි.
''මේ ළමයට වාඩි වෙන්න ඉඩ දෙන්න. අන්න අතතින් වාඩි වෙන්න''

කරුණාවන්ත පෙනුමක් ඇති ගුරුතුමිය කෙරේ ඇතිවුණු පැහැදීම මගේ බිය තුරන් කිරීමට තරමක් ප්‍රමාණවත් විය.

වැදුණු බෙල් එකක ශබ්දයකට අනුව සියලු ම පන්ති නොසන්සුන් විය. අප පන්තියේ ගුරුවරිය ද පොත්පත් කීපයක් රැගෙන වෙනත් පන්තියකට යාමට පිටත් වූවා ය. ළමයින් විශාල පිරිසක් පන්තියේ සිටියත් මට දැනුණේ මහත් ම තනිකමකි. ''තමුසෙ කොහෙ ඉඳලද ඕයි ආවේ?''

මා අසල සිටි ළමයෙකු ඇසුවේ සැරෙනි. ඔහු එය ඇසූ විලාසය අනුව පිළිතුරු දීමට දිව එක්කර ගැනීමට අපහසු බවක් දැනෙයි.

එවිට ම පාසල් කාර්යාලයේදී අපට මුණ ගැසුණු ප්‍රධානාචාර්ය තුමා හෙවත් ජයවර්ධන මහතා අප පන්තියට පැමිණෙන විට පන්තියේ ළමයින්ගේ ඝෝෂාව අඩු විය.

ළමයකුගේ ඉංග්‍රීසි පොතක් ගෙන පෙරළාගත් ඔහු එහි කවියක් කියන ලෙස ගැහැනු ළමයකුට පැවසුවේ ය. මීට කලින් ද පාඩම කියන ලෙස අණ ලැබුණු තැනැත්තිය ඇය විය හැකියයි මට සිතුණේ ඇයගේ සහ ලොකු මහත්තයාගේ ඉරියවු අනුව ය.

''ජැක්-ඇන්-පිල්-වෙනප් හිල් ටු පෙච්'' ඇය තනතනමින් පාඩම කියයි. ඒ පන්තියේ හොඳ ම ළමයා විය හැකි ය.
''ඉස්කෝලෙ මහත්තය මං කියන්නද?'' මගේ අත එසවුණේ ඉබේට ම ය. එසවුණු අත දෙපසට සෙලවුණි.

ළමයි මහ හයියෙන් හිනැහෙන්නට වූහ. මම අත ඔසවා ගෙන ම සිටියෙමි. හිනාවෙන හේතුව පිළිබඳ මට වැටහීමක් නැත.

''අන්න හොඳයි, ආ කියන්න පන්තියෙ ඔක්කොටම ඇහෙන්න. නැගිටින්න. නැගිටල කියන්න.''

මා ඛංකුවෙන් නැගිටුණේ ඉබේට ම වුවත් ඒ සඳහා කලින් පාසැලේ දී ලද පුරුදද්ද බලපාන්නට ඇත.

මම ළමයකුගේ පොතක් රැගෙන නැගිටිටෙමි.

''කියන්න''

''ජැක් ඇන්ඩ් පිල් වෙන්ට් අප් ද හිල් - ටු පෙච් ඒ ජේල් ඔප් වෝටර්'' යනුවෙන් ඉතා පහසුවෙන් මා කවියෙහි කොටසක් කියාගෙන ගියේ කලින් පාසලේ දී ඉංගිරිසි මහත්තයා ලොකු පන්තිවලට කියාදුන් පාඩම්වල මුල් ජේලි කීපයක් ඒ අය පාඩම් කරන විට මාත් පාඩම් කොට මගේ මතකය තුළ තිබූ බැවිනි. පන්තියේ ළමයින්ට පුදුම හිතෙන්න ඇත. සියල්ලෝ ම හිනඩ ය. මා මුල් ජේලිය කියා අවසන් වූ විගස නැවතීමේ අණ ලැබිණි. එය එසේ වීම කොතරම් හොඳද? නැත හොත් ඊ ළඟ කවි ජේලි කියවීමට මට පුළුවන් කමක් නැත.

''හොඳයි, හොඳයි. බොහොම හොඳයි. මොකක්ද නම. ආ... අද නේද? ආවෙ. කලින් කොහේද හිටියෙ?'' ලොකුමහත්තයා ඇසූ ප්‍රශ්න කීපයට එක විට ම පිළිතුරු දීමට පුළුවන් කමක් නැත.

''පියසේන'' මම අත ඉහළට ඔසවා පැවසුවෙමි.
''පියසේන කොහේද කලින් ගියෙ?''

''ක-රන්නගොඩ ඉස්කෝලෙ'' මම ඔසවා ගත් අතින් යුතුව ම පැවසුවෙමි. ගුරුවරයකු සමග කතා කරන විට දකුණු අත්ල පපුව කෙළින් ඔසවා කතා කිරීමට අපට පුරුදු කොට තිබිණි. වරින්වර ඇහෙන ළමය-ින්ගේ කිචිබිචිය මා උදෙසා බව මට පැහැදිලි ය. එක ළමයෙක් තවකෙකුට කතට කොඳුරයි.

''දැන් ආයිත් කියන්න හයියෙන් කියන්න ඕනෙ. ජැක් ඇන්ඩ් පිල් වෙන්ට් අප් ද හිල්'' අන්න එහෙම කට ඇරල කියන්න ඕන. හා පටන් ගන්න ලොකු මහතා බොහෝ ගැඹුරු හඬින් උච්චාරණය කරමින් පැවසුවේ ය.

මම නැවත කවිය කියවන්නට වුණෙමි.

''ජැක් ඇන්ඩ් පිල් වෙන්ට් අප් ද හිල්''
''ජැක් ඇන්ඩ් පිල් අන්න එහෙම'' ලොකු මහතා මා පිටුපසින් සිට කියයි.
මම නැවත පටන් ගනිමි.

මුළු පීරියඩ් එක ම ජේලි දෙකක් හරියට ම ශබ්ද කිරීමට ඉගැන්නුවාට වැඩි යමක් එදින පාඩමෙන් නොකෙරිණි. වැදුණු සීනු ශබ්දයට අනුව ලොකු මහතා පන්තියෙන් පිටවන විට ම මම ඉඳ ගනිමි.

දෙපසෙහි පුටුවල වැදෙමින් මා බිම පතිත වූයේ මහා ශබ්දයක් නගමිනි. මුළු පන්තියේ ම ළමයින් හූ කියමින් හිනැහෙන්නට වූවෙන් මට ඇතිවුණු ලජ්ජාව ඔළුව කොහේදෝ වැදීමෙන් ඇතිවුණු වේදනාවට වඩා වැඩි ය.

මම ඉතා අමාරුවෙන් නැගිට ගනිමි. කිසිවෙක් මට නැගිටීමට උදව්වක් නොදුන් අතර වරින්වර උස් හඬින් ද, මුව තුළ හිර කර ගෙන සිට පිටකරන සිනහව ද මට මහ වදයකි. පන්තියෙන් එළියට බට ලොකු මහතා පන්තියේ ගාලගෝට්ටිය ඔස්සේ නැවත පන්තියට ආවේ කුමක්දැ යි විපරම් කිරීම පිණිස ය.

මට පිටුපසින් සිටි අයකු පුටුව ඉවතට ඇද තිබූ නිසා ලොකු මහත්තයා කෙළින් ම මා සිටි තැනට පැමිණ පෙරළී තිබූ පුටුව දෙස බලා සැරෙන් කතා කළේය.

''කවුද මේ වැඩේ කෙරුවෙ? කවුද කීවෙ නැත්නම් ඔක්කොටම ගහනව.''

මගේ ළඟ ම සිටි ළමයා ''විජේදාස'' යයි කීවේ සෙමිනි.

''කෝ විජේදාස? බව්ද විජේදාස. එනව.. එනව..''

31 වන පිටට